# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
# முதியோர்களுக்கான தேசிய செயலகம்
# National Secretariat for Elders

## ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
## கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
## Ministry of Rural Development, Social Security and Community Empowerment

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා* *-செயலூக்கமான முதுமையை நோக்கி -* *Towards an active ageing*


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல. NSE/DEV/පොදු | ඔබේ අංකය<br>Your No. | දිනය<br>Date 2026.01. 27 |

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් - 2026</u>

2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙහි ප්‍රධාන අරමුණ ශ්‍රී ලංකාවේ සිටින වැඩිහිටි තැනැත්තන්ගේ සුබසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ වැඩිහිටි තැනැත්තන්ට ආත්ම ගෞරවයක්, ස්වාධීනත්වයක් හා ගරුත්වයක් ඇතිව ජීවත්වීමට අවස්ථාව සලසා දීමය.

02. ඒ අනුව මෙම කාර්යාලය මඟින් රටෙහි සමස්ථ වැඩිහිටි ප්‍රජාව උදෙසා ක්‍රියාත්මක කරනු ලබන සියලු වැඩසටහන් භාණ්ඩාගාර අරමුදල සහ වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල යන අරමුදල් ප්‍රභව දෙක යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර, 2026 වර්ෂයෙහි අනුමත ක්‍රියාකාරී සැලැස්ම පරිදි සියලු දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩිහිටි සුබසාධනය උදෙසා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩසටහන් පහත පරිදි වේ.

***භාණ්ඩාගාර අරමුදල් මඟින් ක්‍රියාත්මක වැඩසටහන්***

- අඩුආදායම්ලාභී වැඩිහිටියන් උදෙසා ශ්‍රවණ උපකරණ සහ ඇස් කන්ණාඩි ලබා දීම.
- වයස අවුරුදු 60 ඉක්මවූ වැඩිහිටියන්ගේ කායික හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සෑම දිස්ත්‍රික්කයකම වෛද්‍ය කඳවුරු 03 බැගින් පැවැත්වීම. මෙහිදී එක් වෛද්‍ය කඳවුරක් වෙනුවෙන් රු.100,000/- ක් බැගින් වන සේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලබාදීම.
- අඩු ආදායම්ලාභි වැඩිහිටියන් සඳහා තම නිවස තුළ ජීවත්වීමේ දී අවශ්‍ය කරනු ලබන අවම පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සලසා දීම අරමුණු කරගනිමින් "සුවපහසු" මූල්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ එක් අයකු සඳහා රු.100,000/- ක උපරිමයකට යටත්ව එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු.293,000/- ක් වන සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලබාදීම.
- වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම යටතේ අලුත්වැඩියාව හා උපකරණ ලබාදීම වෙනුවෙන් එක් නිවාසයකට රු.මිලියන 02 බැගින් වැඩිහිටි නිවාස 20 ක් සඳහා මූල්‍යාධාර ලබා දීම.
  මෙහිදී අවශ්‍යතා සහිත දිස්ත්‍රික්කයන්ගෙන් ඉල්ලීම් ලබාගෙන, ඒ සඳහා අදාළ දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ලබයි.
- වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.
- වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා වැඩිහිටි දීමනාව සහ සියවස් සපිරි දීමනාව ලබාදීම.
- වැඩිහිටියන් සඳහා නීති පහසුකම් සැලසීම (වැඩිහිටි නඩත්තු මණ්ඩලය).
- ජාත්‍යන්තර වැඩිහිටි දිනය / වැඩිහිටි අපයෝජන දිනය සැමරීම.


ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138

*වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල මඟින් ක්‍රියාත්මක වැඩසටහන්*

- දිවයින පුරා පිහිටුවා ඇති වැඩිහිටි කමිටු සවිබලගැන්වීම සඳහා භෞතික උපකරණ ලබා ගැනීමට එක් සමිතියකට රු.100,000/- ක උපරිමයකට යටත්ව සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙත සමිති 02 ක් සඳහා ආධාර ලබා දීම.

- වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම හා දිවා මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට රු.මිලියන 3.5 බැගින් මූලාධාර ලබා දීම. මේ යටතේ සියලු දිස්ත්‍රික්කයන් නියෝජනය වන පරිදි දිස්ත්‍රික් 25 තුළ දිවා මධ්‍යස්ථාන 25 ක් ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ.

- වැඩිහිටියන් උදෙසා ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු.75,000/- ක මුදලක් ලබාදීම.

  මෙම වැඩසටහන් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඔක්තෝබර් මස පවත්වා අවසන් කළ යුතුය.

- විශ්‍රාම යාමට ආසන්නයේ සිටින නිලධාරීන් සඳහා විශ්‍රාම දිවිය අර්ථවත් ලෙස ගත කිරීම සම්බන්ධව විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු.20,000/- ක මුදලක් ලබාදීම.

  මෙම වැඩසටහන් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඔක්තෝබර් මස 08 දිනට යෙදෙන ජාතික විශ්‍රාමික දිනයේදී පැවැත්විය යුතුය.

- "මා දකින වැඩිහිටි ලොව " තේමාව යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීව පාසැල් සිසුන් සඳහා චිත්‍ර තරඟයක් පැවැත්වීමේ වැඩසටහන. මේ සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු.20,000/- ක මුදලක් ලබා දෙනු ලැබේ.

- වැඩිහිටියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු.30,000/- ක මුදලක් ලබාදීම.

  මෙම වැඩසටහන් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඔක්තෝබර් මස 10 දිනට යෙදෙන ලෝක මානසික සෞඛ්‍ය දිනයේදී පැවැත්විය යුතුය.

- අවුරුදු 60 ට වැඩි සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් වෙනුවෙන් සියලු දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි, එක් නිවාසයකට රු.1,000,000/- ක උපරිමයකට යටත්ව නිවාස 25 ක් ඉදි කිරීම.

- අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත තෝරා ගනු ලැබූ රෝගයන් වෙනුවෙන් රෝගාධාර ලෙස එක්වරකදී පමණක් ගෙවනු ලබන රු.25,000/- ක ආධාර මුදලක් ලබා දීම සඳහා ක්‍රියාත්මක "ආරෝග්‍යා" වැඩිහිටි වෛද්‍යාධාර යෝජනා ක්‍රමය. මේ යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඉල්ලුම්කරුවන් 02 කු සඳහා ආධාර ලබාදීම සිදු කරනු ලබයි.

- වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටියන් සඳහා තම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ස්වයං රැකියා ආධාර ලෙස එක් අයකුට රු.50,000/-ක උපරිමයකට යටත්ව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඉල්ලුම්කරුවන් 02 කු වෙත ආධාර ලබාදීම.

03. ඉහත වැඩසටහන් වලට අදාල වැඩසටහන් විස්තරය, උපදෙස් මාලාවන් සහ අයදුම්පත්‍ර මෙම කාර්යාලයෙහි වෙබ් අඩවිය වන www.nse.gov.lk මඟින් ලබාගත හැකි අතර, මෙම ප්‍රතිලාභ ඔබ දිස්ත්‍රික්කයේ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි වැඩිහිටි ප්‍රජාව වෙත ලබාදීමට අදාල සියලු නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

04. මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ.චතුර මිහිඳුම්
අධ්‍යක්ෂ